# ජාතිවාදය සහ ආගමික

# අන්තවාදය

# එපා! එපා! එපා!

පසුගිය අප්‍රේල් මාසයේ සිට ගත වූ කාලය තුළ මුස්ලිම් පල්ලි, මුස්ලිම් ව්‍යාපාරික ස්ථාන සහ මුස්ලිම් දේපලවලට කරන ලද පහරදීම් සංඛ්‍යාව විස්සකට අධිකයි. මේ සෑම ප්‍රහාරයක්ම සංවිධානය කොට දියත් කරන ලද්දේ වාර්ගික සහ ආගමික අන්තවාදී කල්ලි කිහිපයක් විසිනි. එසේම, 2015 ජනවාරියේ සිට මේ වන විට ක්‍රිස්තියානි නමස්කාර ස්ථාන සියයකට වැඩි ගණනකට අනතුරු සිද්ධ කොට තිබේ. ඒවා පසුපස සිටින්නේ ද, වාර්ගික සහ ආගමික අන්තවාදී කල්ලි කිහිපයකි.

පසුගිය පාලන කාලයේ සුළු ජාතික ප්‍රජාවන් සහ සුළුතර ආගමික කණ්ඩායම් එල්ල කොට මෙවැනිම ප්‍රහාර රැල්ලක් දියත් විය. එහෙත් එදා පැවති ආණ්ඩුව ඒ කිසි සිදුවීමක් ගැන නීතිමය පියවර ගත්තේ නැත. ඇතැම් අවස්ථාවල, එවැනි අන්තවාදී කල්ලිවලට බලධාරීන් වක්‍රාකාරයෙන් සහයෝගය පළ කළ ස්වභාවයක් ද එදා දක්නට ලැබුණි.

වාර්ගික සහ ආගමික අසමගිය නිසා රටක් වශයෙන් මේ වන විට අප ගෙවා ඇති වන්දිය අති විශාලයි. අවුරුදු තිහකට කිට්ටු කාලයක සිවිල් යුද්ධයක් විසින් මුළු රටම ගිල ගත් බව අපි දනිමු.

රටේ පැවති ප්‍රජාතන්ත්‍රීය ආයතන පද්ධතිය පමණක් නොව, ශිෂ්ට සම්පන්න මානුෂීය ගුණධර්මත් එම යුද්ධය තුළ බිලි ගැනුණි. අවසානයේ යුද්ධය විසින් අපට ඉතිරි කෙළේ එකිනෙකා දෙස සැකයෙන් සහ පසමිතුරු ආකල්පයකින් බලන සමාජයකි.

යහපාලන ආණ්ඩුව බලයට පත්වුණේ, ජාතීන් සහ ආගමික කණ්ඩායම් අතර සමගිය ඇති කරමින්, ජාතික ප්‍රශ්නයට දේශපාලනික විසඳුමක් ලබා දීම සඳහා ප්‍රතිඥා දෙමිනි. ඒ අනුව, සංහිඳියාව සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් ජනාධිපතිවරයා විසින්ම අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනුණි. ඊට සමගාමීව ජාත්‍යන්තරය සමග සම්මුතීන් ඇති කර ගත් අපි, නැවත යුද්ධයක් ඇති නොවන තැනට වගබලා ගන්නා බවට ජාත්‍යන්තරයට සපථ කොට සිටියෙමු. එසේම, එම ප්‍රතිඥා අනුව ක්‍රියාකරමින්, සංහිඳියා යාන්ත්‍රණ සඳහා වන ජනතා අදහස් ලබා ගැනීමේ ක්‍රියාවලියක් දියත් කොට ඒ පිළිබඳ නිර්දේශ ඇතුළත් වාර්තාවක් මේ වන විට ආණ්ඩුව ලබාගෙන තිබේ. ඊට අමතරව, ජාතික සංහිඳියාව සඳහා වන වැඩ සටහන් ගණනාවක් විවිධ අමාත්‍යාංශ යටතේ ක්‍රියාවට නගා ඇත. තවද, ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගායනා කිරීම වැනි වැදගත් සංකේතාත්මක පියවරවල සිට, අවතැන්වූවන් නැවත පදිංචි කිරීම් සහ උතුරු නැගෙනහිර සිවිල් ජනතාවගේ ඉඩකඩම් සහ නිවාස යම් ප්‍රමාණයක් ආපසු ඔවුන්ට පවරා දීම දක්වා වන ඇතැම් නිශ්චිත සාධනීය පියවර කෙරෙහි ද යොමු වී සිටී.

අවශ්‍ය පරිමාණයෙන් සහ කඩිනමින් මේ කටයුතු සිද්ධ නොවෙතත්, මෙය ජාතික සංහිඳියාව සඳහා වන යම් සංයුක්ත ආරම්භයක් සනිටුහන් වන මොහොතකි. එවැනි අවස්ථාවක, ජාතිවාදී, ආගම්වාදී සහ පටු දේශපාලනික හේතු පෙරදැරිව, රටත් ජනතාවත් ආපස්සට ඇදගෙන යාමේ ප්‍රයත්නයක් ඇතැම් ජාතිවාදී සහ ආගමික අන්තවාදී කොටස් විසින් දියත් කරමින් සිටී. මේ අනතුර පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වගකීමක් අපට තිබේ. එසේම, මෙම භයානක තත්වය පාලනය කිරීම සඳහා කඩිනම් පියවර වහා ගත යුතුව ඇති බව රජයට දන්වා සිටීමත් අපේ වගකීමකි.

අද වන විට මේ රටේ සමස්ත මුස්ලිම් ප්‍රජාවත්, ඇතැම් කිතුණු ආගමික පර්ෂදත් සිටින්නේ නිරන්තර බියෙනි. සැකයෙනි. එක පැත්තකින් තමන් වෙත එල්ල වන රුදුරු ප්‍රහාර දිනෙන් දින වර්ධනය වීමේ ප්‍රවණතාවක් දකින ඔවුහු, ඒ ප්‍රහාරයන් අරභයා අදාළ බලධාරීන් නිසි පියවර නොගැනීම ගැන විමතියටත්, කෝපයටත් පත්වෙති.

මේ අනතුර, මුස්ලිම් ජාතිකයන්ට සහ කිතුණු සුළුතර ආගමික පර්ෂදවලට පමණක් බලපාන ප්‍රශ්නයක් වශයෙන් ගත යුතු නැත. ඇත්ත වශයෙන්ම එය, සමස්ත ලාංකික ප්‍රජාවටම බලපාන ප්‍රශ්නයකි. වාර්ගික සහ ආගමික ගැටුම්වලින් නැවත වරක් මේ රට ගිනි ගත්තොත්, ඉහත සඳහන් සුළුතර ප්‍රජාවන් පමණක් නොව, සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවම ඒ ගින්නෙන් පිළිස්සෙනු නිසැකයි.

එසේ හෙයින්, රටේ ජනතාව ආරක්ෂා කිරීමට බැඳී සිටින රජයට මේ තත්වය පාලනය කිරීමේ පරම වගකීම පැවරෙයි. එම වගකීම රජය ඉටු කළ යුත්තේ, මෙකී සිදුවීම්වලට වගකිවයුතු පුද්ගලයන් තරාතිරම නොබලා නීතිය ඉදිරියට පැමිණ වීමෙනි. එම වගකීම පැහැර හරින හෝ පමා කරන දවසක් පාසා, ජාතික සංහිඳියාව පිළිබඳ අපේක්ෂාව අනතුරට ලක්වන බව බලධාරීන්ට අපි අවධාරණයෙන් යුතුව කියා සිටිමු.

1. පූජ්‍ය දඹර අමිල හිමි
2. බිෂොප් දුලිප් ඩි. චිකේරා
3. ජයන්ත ධනපාල
4. චන්ද්‍රා ජයරත්න
5. මහාචාර්ය එච්. එල්. සෙනෙවිරත්න
6. මහාචාර්ය සරත් විජේසූරිය
7. ගාමිණී වියන්ගොඩ
8. මනෝරි මුත්තෙට්ටුවෙගම
9 ආචාර්ය ධර්මසේන පතිරාජ
10. ධර්මසිරි බණ්ඩාරනායක
11. අශෝක හඳගම
12. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න
13. විනිසුරු සලීම් මර්සූෆ්
14. අර්ජුන අළුවිහාරේ
15. නීතිඥ ජාවිඩ් යූසුෆ්
16. මහාචාර්ය රිස්වි ෂෙරීෆ්
17. සුනිල් පෙරේරා (ජිප්සීස්)
18. ලූෂන් බුලත්සිංහල
19. පරාක්‍රම නිරිඇල්ල
20. කේ. ඩබ්. ජනරංජන
21. එම්. ඩී. මහින්දපාල
22. නීතිඥ බැසිල් ප්‍රනාන්දු
23. බුද්ධදාස ගලප්පත්ති
24. මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න
25. ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න
26. කෙලී සේනානායක
27. ආචාර්ය රංජිණී ඔබේසේකර
28. ජෙසීමා ඉස්මායිල්
29. නීතිඥ නාමල් රාජපක්ෂ
30. නීතිඥ සුදර්ශන ගුණවර්ධන
31. සමන් රත්නප්‍රිය
32. නිශ්ශංක දිද්දෙනිය
33. මහාචාර්ය දයා සෝමසුන්දරම්
34. අනෝමා රාජකරුණා
35. විමුක්ති ජයසුන්දර
36. අජිත් ජිනදාස
37. චන්ද්‍රගුප්ත තේනුවර
38. අනුර රාජගුරු
39. හේමසිරි ලියනගේ
40. ආචාර්ය සුජාතා ගමගේ
41. සන්ධ්‍යා එක්නැලිගොඩ
42. බෙනට් රත්නායක
43. සෝමරත්න දිසානායක
44. රොෂාන් පිලපිටිය
45. මහාචාර්ය සාවිත්‍රී ගුණසේකර
46. නීතිඥ ලාල් විජේනායක
47. නීතිඥ ලක්ෂාන් ඩයස්
48 මහාචාර්ය එම්. ඒ. නුහුමාන්
49. ආචාර්ය ලයනල් බෝපගේ
50. එල්මෝ පෙරේරා
51. මහින්ද රත්නායක
52. ආචාර්ය චන්දන අලුත්ගේ
53. මහින්ද ප්‍රසාද් මස්ඉඹුල
54. දිලීප් රෝහණ
55. බ්‍රිටෝ ප්‍රනාන්දු
56. අනුරසිරි හෙට්ටිගේ
57. ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු
58. ජයතිලක බණ්ඩාර
59. නීතිඥ මාස් යූසුෆ්
60. කෞෂල්‍යා ප්‍රනාන්දු
61. චාන්දනී සෙනෙවිරත්න
62. සමනලී ෆොන්සේකා
63. ලක්ෂ්මන් මෙන්ඩිස්
64. හර්ෂ බුලත්සිංහල
65. මාලක දේවප්‍රිය
66. මහාචාර්ය කුමාර් ඩේවිඩ්
67. මොහාන්රාජ් මඩවල
68. සුනන්ද දේශප්‍රිය
69. පිලිප් දිසානායක
70. රාජා උස්වැටකෙයියාව
71. රාජිත දිසානායක
72. ටී.කේ. අසූර්
73. රංග බණ්ඩාරනායක
74. ෆ්‍රෙඩී ගමගේ
75. ෂාන් විජේතුංග
76. ශාන්ති දිසානායක
77. ආචාර්ය උදාන් ප්‍රනාන්දු
78. නීතිඥ උපුල් කුමරප්පෙරුම
79. ඩබ්ලිව්.ජයසිරි
80. ඉන්ද්‍රචාපා ලියනගේ
81. කැත්ලීන් ජයවර්ධන
82. ආචාර්ය ලක්සිරි ප්‍රනාන්දු
83. අනුලා බුලත්සිංහල
84. විසාකා ධර්මදාස
85. ලක්ෂ්මන් හේවාවිතාරණ
86. නිෂාන් ඩි. මෙල්
87. සුමතිපාල කාරියවසම්
88. උපාලි ජයතිලක
89. ජනාධිපති නීතිඥ ජේ. සී.වැලිඅමුණ
90. ආචාර්ය ලියනගේ අමරකීර්ති
91. ජයතිලක කම්මැල්ලවීර
92. බෙනට් රත්නායක
93. නිලන්ත ඉලංගමුව
94. පියල් කාරියවසම්
95. චන්දන කීර්ති බණ්ඩාර
96. ලක්ෂ්මන් ගුණසේකර
97. කීර්ති වැලිසරගේ
98. මහින්ද හත්තක
99. මහේෂ් මුණසිංහ
100. දීපානි සිල්වා
101. ෆයිස්-උර් රහමන්
102. අන්තෝනිදාසන් ජේසුදාසන්
103. මංජුල වෙඩිවර්ධන
104. ආචාර්ය ඒ. සී. විශ්වලිංගම්
105. සෞම්‍ය ලියනගේ
106. සමන් වගආරච්චි
107. ආචාර්ය ජයසිරි පීරිස් පියනම
108. ප්‍රදීපන් රවීන්ද්‍රන්
109. ආචාර්ය හේමමාලී ගුනසිංහ
110. අරුණ ද සොයිසා
111. ජයතිලක ද සිල්වා
112. හිල්මි අහමඩ්
113. චන්න ඒකනායක
114. උදය කළුපතිරණ
115. ෂීක් එස්.එච්.එම්. ෆලීල්
116. සිසිර ජයමහ
117. ෂර්ලි තිසේරා
118. ආර්. එස්. ජයරත්න
119. අසාද් සාලි
120. පර්සි තේනුවර
121. වසන්ත කුලතුංග
122. ෂලිලා මුණසිංහ
123. නජා මොහොමඩ්
124. දොස්තර සිවකුමාරන්
125. පාලිත ලිහිනියකුමාර
126. රිචඩ් තනිප්පුලිආරච්චි
127. චන්ද්‍රසෝම බිංදුහේවා
128. දොස්තර රාජා විජේතුංග
129. කවුඩුල්ලේ ජයතිස්ස
130. ගැමුණු විජේරත්න
131. ලතීෆ් ෆාරුක්
132. මහාචාර්ය එස්.බී.එස්. අබේකෝන්
133. ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසීස්
134. රීඩ් ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමා
135. මහාචාර්ය ඩෙස්මන්ඩ් මල්ලිකාරච්චි
136. හරීන්ද්‍ර දුනුවිල
137. එස්. රනුග්ගේ
138. එස්. ජී. පුංචිහේවා
139. මහාචාර්ය ඩබ්.එම්.කේ.විජේතුංග
140. ආචාර්ය කමල් නිශ්ශංක
141. කීර්ති කාරියවසම්
142. රාජා උස්වැටකෙයියාව
143. සමරවීර වීරවන්නි
144. රීසා යෙහියා
145. ඩී. එම්. ඩී. අබේරත්න
146. ලක්ෂ්මන් විජේසේකර
147. මුජිබුර් රහුමාන්
148. නීතිඥ චන්ද්‍රපාල කුමාරගේ
149. ආචාර්ය පැරකුම් ඕවිටිගල
150. ජේ. එස්. කුරුප්පු
151. සීතා රංජනී
152. රන්ජන් ප්‍රනාන්දු
153. රනත් කුමාරසිංහ
154. තාරික් මහමුඩ්
155. ගයා නාගහවත්ත
156. ආචාර්ය එම්.ඒ.එම්. ෂුක්රි
157. කේ. සංජීව
158. සිරිවිකුම් ආරියරත්න
159. රජීව් සෙබස්තියන්
160. අනුර බැස්ටියන්
161. කිත්සිරි අබයසිංහ
162. ටැසී සෙනෙවිරත්න
163. කෞෂල්‍ය කුමාරසිංහ
164. රංජිත් විජේනායක
165. ලසන්ත රුහුණගේ
166. චන්න ඒකනායක
167. එම්. ජේ. ආර්. ඩේවිඩ්
168. සිරිමසිරි හපුආරච්චි
169. ප්‍රීති පෙරේරා
170. රුකී ප්‍රනාන්දු
171. වසන්ති සේනාරත්න
172. මහේන් ගුණසේකර
173. මහාචාර්ය ආර්. එස්. පෙරින්බනායගම්

'පුරවැසි බලය'
සහ
'සාධාරණ සමාජයක් සඳහාවූ ජාතික ව්‍යාපාරය'